මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

නිකුත් කළේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
දිනය 2023.11.24

# මුදල් ප්‍රතිපත්ති විවරණය: අංක 08 - 2023 නොවැම්බර්

## ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාතික තවදුරටත් අඩු කරයි

*ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය 2023 නොවැම්බර් මස 23 වැනි දින පැවති රැස්වීමේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR), පිළිවෙළින්, සියයට 9.00 සහ සියයට 10.00 දක්වා පදනම් අංක 100කින් අඩු කිරීමට තීරණය කළේය. ආර්ථිකයට එහි විභව නිමැවුම් මට්ටමට ළඟා වී එම මට්ටමේ ස්ථායී වීමට සහාය වෙමින්, මැදි කාලීනව උද්ධමනය ඉලක්කගත සියයට 5ක මට්ටමට ළඟා කර ගැනීමේ හා පවත්වාගෙන යෑමේ අරමුණින්, දේශීය හා ගෝලීය ආර්ථිකයේ වත්මන් සහ අපේක්ෂිත ප්‍රවණතා පිළිබඳ මනාව සලකා බැලීමෙන් අනතුරුව මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය මෙම තීරණයට එළැඹිණි. දේශීය හා ගෝලීය වශයෙන් අපේක්ෂිත ප්‍රවණතා මගින් ඇති වන සැපයුම් අංශයේ සාධක හේතුවෙන් නුදුරු කාලීන උද්ධමන පුරෝකථන සඳහා ඇති විය හැකි ඉහළ යෑමේ අවදානම් මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් සැලකිල්ලට ගන්නා ලදී. කෙසේ වෙතත්, මහජනතාවගේ උද්ධමන අපේක්ෂා පාලනය වී ඇති නිසාත් ආර්ථික ක්‍රියාකාරකම් නුදුරු කාලයේ සිට මැදි කාලය දක්වා විභව නිමැවුම් මට්ටමට වඩා අඩු මට්ටමක පවතිනු ඇතැයි පුරෝකථනය කර ඇති නිසාත්, එවැනි නුදුරු කාලීන උද්ධමනය ඉහළ යෑමේ අවදානම් මැදි කාලීන උද්ධමන ඉදිරි දැක්ම වෙනස් නොකරනු ඇති බව මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ අදහස විය. තවද, මෙම ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කිරීම මෙන්ම 2023 වසරේ ජූනි මස සිට ක්‍රියාත්මක කරන ලද මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සමඟ මැදි කාලීනව උද්ධමනය ස්ථායී කිරීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමක් සිදු වී ඇති බව මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ අදහස විය. එබැවින්, ඉදිරි කාලසීමාව තුළදී වෙළඳපොළ පොලී අනුපාතික සාමාන්‍යකරණය කිරීම වේගවත් කරමින්, මූල්‍ය ආයතන විසින් මුදල් ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ග කඩිනමින් සහ පූර්ණ වශයෙන් වෙළඳපොළ පොලී අනුපාතික, විශේෂයෙන්ම ණය පොලී අනුපාතික, වෙත සම්ප්‍රේෂණය කිරීමේ අවශ්‍යතාවය මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් අවධාරණය කරන ලදී.*

අඩු ඉල්ලුම් තත්ත්ව පිළිබිඹු කරමින් මතුපිට උද්ධමනය අඛණ්ඩව පහළ මට්ටමක පවතී. කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කො.පා.මි.ද., 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2023 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 1.3ට සාපේක්ෂව 2023 ඔක්තෝම්බර් මාසයේදී සියයට 1.5ක් ලෙස වාර්තා විය. ආහාර උද්ධමනය 2023 ඔක්තෝම්බර් මාසයේදී අඛණ්ඩව සිව්වන මාසයටත් සෘණ අගයක (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) පැවතුණි. ජාතික පාරිභෝගික මිල දර්ශකය මත (ජා.පා.මි.ද., 2021=100) මත පදනම් වූ මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) 2023 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 0.8ට සාපේක්ෂව 2023 ඔක්තෝම්බර් මාසයේදී සියයට 1.0ක් ලෙස වාර්තා විය. ආර්ථිකයේ යටිදැරි ඉල්ලුම් පීඩනය පිළිබිඹු කරන කො.පා.මි.ද. මෙන්ම ජා.පා.මි.ද. මත පදනම් වූ මූලික උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) ආර්ථිකයේ අඩු ඉල්ලුම් පීඩන පිළිබිඹු කරමින් 2023 ඔක්තෝම්බර් මාසයේදී තවදුරටත් අඩු විය. 2024 ජනවාරි මස සිට බලපැවැත්වෙන පරිදි රජය විසින් යෝජනා කරන ලද එකතු කළ අගය මත බද්ද සංශෝධනය කිරීම ප්‍රධාන වශයෙන් හේතු වෙමින් උද්ධමනයේ එක් වරක් ඉහළ යෑමක් නුදුරු කාලයේ අපේක්ෂා කෙරේ. යටිදැරි ඉල්ලුම් පීඩන අඩු මට්ටමක පැවතීම හේතුවෙන් බදු ක්‍රියාමාර්ග සහ වෙනත් ප්‍රවණතා මගින් අනෙකුත් අංශ වෙත වන බලපෑම් පාලනය වී පවතින බැවින් උද්ධමනයේ මෙම වැඩිවීම තාවකාලික වනු ඇත. ඒ අනුව, යෝග්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල සහාය ඇතිව මැදිකාලීනව උද්ධමනය ඉලක්කගත සියයට 5 මට්ටමට ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**මතුපිට උද්ධමනයේ පුරෝකථන**
**කොළඹ පාරිභෝගික මිල දර්ශකය* (කාර්තුමය සාමාන්‍යය, වාර්ෂික ලක්ෂ්‍යමය, %)**




* සටහන: උද්ධමන ව්‍යාප්ති සටහනෙහි (Fan chart) 2022 වසරේ සිව්වන කාර්තුව දක්වා වාර්තා කරන ලද දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100, සෘතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද (seasonally adjusted)) මත පදනම් වන අතර මෙම කාල සීමාවෙන් පසු දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2021=100, සෘතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද) මත පදනම් වේ. එම සියලුම ප්‍රකාශිත දත්ත මත පුරෝකථන පදනම් වේ.

***මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන***

*උද්ධමන ව්‍යාප්ති සටහන මගින් මූලික පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතාව ක්‍රමයෙන් වර්ණය අඩු වන පරිදි වූ විශ්‍රම්භ පරාස භාවිත කිරීමෙන් විදහා දැක්වේ. රූප සටහනේ දැක්වෙන විශ්‍රම්භ ප්‍රාන්තර (Confidence Intervals, CI) මගින් මැදිකාලීන උද්ධමනය විචලනය විය හැකි අගය පරාසයන් දක්වයි. උදාහරණයක් ලෙස, තද කොළ පැහැති ප්‍රදේශය සියයට 50 විශ්‍රම්භ ප්‍රාන්තරය නිරූපණය කරන අතර, එමගින් උද්ධමනයේ සැබෑ අගය මෙම පරාසය තුළ පැවතීමේ සියයට 50ක සම්භාවිතාවක් පවතින බව හඟවනු ලබයි. විශ්‍රම්භ පරාසයන් මගින් උද්ධමනය දීර්ඝ කාලයකට පුරෝකථනය කිරීමේදී ඇතිවිය හැකි අවිනිශ්චිතතාවයේ ඉහළ යෑම පෙන්නුම් කරයි.*

**සටහන: පුරෝකථනයක් යනු පොරොන්දුවක් හෝ බැඳීමක් නොවේ.**

මෙම පුරෝකථන, 2023 නොවැම්බර් මස පුරෝකථන වාරයේදී පැවති දත්ත, උපකල්පන සහ විනිශ්චයන් මත පදනම්ව සිදු කර ඇත. එම පුරෝකථන වාරයේ පැවති ගෝලීය ඉන්ධන සහ ආහාර මිල පිළිබඳ වන පුරෝකථන; ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වන ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ ආර්ථික වර්ධනය; ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය යටතේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ පුරෝකථන අනුව අපේක්ෂිත දේශීය රාජ්‍ය මූල්‍ය ඉදිරි දැක්ම සහ 2024 රාජ්‍ය අයවැය කතාවේ යෝජිත ප්‍රධාන වෙනස්කම්; සහ ඇමරිකා එක්සත් ජනපදයේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මඟින් නිරූපණය වන ගෝලීය මූල්‍ය තත්ත්ව යනාදී කරුණු මත මෙම පුරෝකථන රඳා පවතී. තවද, ආර්ථික ආකෘති මගින් ලබාදෙන පොලී අනුපාතික මාර්ගය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන සාර්ව ආර්ථික ක්‍රියාමාර්ග මත පුරෝකථන රඳා පවතී. මෙම උපකල්පනවල සිදුවන සැලකිය යුතු මට්ටමේ වෙනස්කම් සැබෑ උද්ධමනය පුරෝකථනය කළ මාර්ගයෙන් අපගමනය වීමට හේතු විය හැකිය.

පවත්නා දේශීය හා ගෝලීය ආර්ථික අවිනිශ්චිතතා, අහිතකර කාලගුණ තත්ත්ව සහ භූ-දේශපාලනික අර්බුද මධ්‍යයේ වත්මන් පුරෝකථන හා සම්බන්ධ අවිනිශ්චිතතා සාමාන්‍ය කාලයන්ට වඩා ඉහළ මට්ටමක පවතී. පුරෝකථන සඳහා සෘජුව හෝ වක්‍රව භාවිතා වන විවිධ සාධක ඒවායේ දැනට සලකා ඇති මට්ටම් වලින් අපගමනය වීමේ හැකියාව හේතුවෙන් මෙම අවිනිශ්චිතතා හට ගනී. විශේෂයෙන්, බදු වැඩි වීමේ හැකියාව සහ එමඟින් ඇති විය හැකි වක්‍ර බලපෑම්, වැටුප් වැඩි වීම් සිදු වීමට ඇති හැකියාව, බලශක්ති මිල ගණන් වල ඇති විය හැකි විශාල වැඩි වීම්, ආනයන සීමා ලිහිල් කිරීම මධ්‍යයේ අපේක්ෂිත මට්ටම් වලට වඩා වැඩියෙන් විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමට ඇති හැකියාව, ඇති විය හැකි අයහපත් කාලගුණ තත්ත්ව හේතුවෙන් කෘෂිකාර්මික නිෂ්පාදනයට සිදුවන බලපෑම හා එමගින් ආහාර උද්ධමනයේ ඇති විය හැකි ඉහළ යෑම වැනි සාධක මගින් උද්ධමන පුරෝකථන ඉහළ යෑමේ බලපෑම් ඇති කළ හැකිය. මේ අතර, පුරෝකථන සඳහා පහළ යෑමේ අවදානම් සැලකූවිට, සැපයුම් තත්ත්ව වේගයෙන් යථා තත්ත්වයට පත්වීමට ඇති හැකියාව සහ මහජනතාවගේ මිලදී ගැනීමේ ශක්තිය හීන වීමේ තිරසාර බලපෑම ඇතුළත් වේ.

මහජනතාවට දැනුම්වත් තීරණ ගැනීමට හැකිවන පරිදි උද්ධමන දැක්මෙහි අපේක්ෂිත වෙනස්කම් නිරන්තරව ඔවුන්ට සන්නිවේදනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව කැපවී සිටියි.

ඉදිරි කාලය තුළදී වෙළඳපොළ පොලී අනුපාතික සාමාන්‍ය මට්ටමට ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ. වෙළඳපොළ පොලී අනුපාතික අඛණ්ඩව අඩු වූ අතර බොහෝ පදනම් පොලී අනුපාතික සැලකිය යුතු ලෙස අඩු විය. මේ අතර, අවදානම් අධි මිල පහළ යෑමත් සමඟ රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික ද අඩු වෙමින් පවතී. මෙම මුදල් ප්‍රතිපත්ති විවරණයේදී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 100කින් අඩු කිරීම ඉදිරි කාලය තුළදී වෙළඳපොළ පොලී අනුපාතික පහළ යෑමට සහ සාමාන්‍ය තත්ත්වයට පත් වීමට තවදුරටත් අවකාශ නිර්මාණය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සම්ප්‍රේෂණය වීම පිළිබිඹු කරමින් බැංකු අංශය විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය, මාසිකව 2023 සැප්තැම්බර් මෙන්ම තාවකාලික දත්ත මත පදනම්ව, ඔක්තෝබර් මාසයේදී ද ඉහළ ගියේය. වෙළඳපොළ ණය පොලී අනුපාතිකවල අපේක්ෂිත අඩු වීමත් සමඟ පෞද්ගලික අංශය වෙත ලබා දෙන ණය ඉදිරි කාලසීමාව තුළදී තවදුරටත් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමගින් දේශීය ආර්ථික ක්‍රියාකාරකම් අපේක්ෂිත යථා තත්ත්වයට පත්වීම සඳහා සහාය වනු ඇත.

## මැදි කාලීන ස්ථායී උද්ධමන ඉදිරි දැක්ම සහ අඩු ඉල්ලුම් පීඩන පැවතීම හේතුවෙන් ප්‍රතිපත්ති පොලී අනුපාතික තවදුරටත් අඩු කෙරේ

ඉහත දැක්වූ වත්මන් සහ අපේක්ෂිත සාර්ව ආර්ථික ප්‍රවණතා සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය, 2023 නොවැම්බර් මස 23 වැනි දින පැවති රැස්වීමේදී, මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR), පිළිවෙළින්, සියයට 9.00 සහ සියයට 10.00 දක්වා පදනම් අංක 100කින් අඩු කිරීමට තීරණය

කළේය. මෙම ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කිරීමත් සමග සහ පවතින දත්ත අනුව, මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් ලිහිල් කිරීම නුදුරු කාලීනව සිදු නොකිරීමට මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ අදහස විය. එමගින් වත්මන් සහ පසුගිය මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට අනුකූලව වෙළඳපොළ පොලී අනුපාතික අඩු වීමට අවශ්‍ය අවකාශය ලබා දෙනු ලැබේ. 2023 ජූනි මාසයේ සිට ක්‍රියාත්මක කරන ලද මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ගවලට අනුකූලව සමස්ත වෙළඳපොළ ණය පොලී අනුපාතික වේගයෙන්, සැලකිය යුතු ලෙස සහ පුළුල් පදනමකින් අඩු වනු ඇතැයි මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය අපේක්ෂා කරයි. දේශීය මුදල් තත්ත්ව තවදුරටත් ලිහිල් කිරීම සඳහා එවැනි පොලී අනුපාතික අඩු වීම් අත්‍යවශ්‍ය වේ. මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ගවල ප්‍රතිලාභ ව්‍යාපාර සහ කුටුම්භ වෙත ප්‍රමාණවත් ලෙස ලබා දීම සහතික කිරීම සඳහා වෙළඳපොළ ණය පොලී අනුපාතික අඩු කිරීමට සියලු බලපත්‍රලාභී බැංකු කඩිනම් පියවර ගැනීමේ අවශ්‍යතාව මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය අවධාරණය කළේය.

මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය උද්ධමන පුරෝකථන සඳහා පවතින අවදානම් සහ අනෙකුත් සාධක අඛණ්ඩව සලකා බලනු ඇති අතර, ආර්ථිකයට එහි විභව නිමැවුම් මට්ටම කරා ළඟා වීමට සහාය වන අතරම ඉදිරි කාලය තුළදී දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට සූදානම්ව සිටියි.

<table>
<tr><td rowspan="3">මුදල් ප්‍රතිපත්ති තීරණය</td><td colspan="2">ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කෙරේ</td></tr>
<tr><td>නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR)<br>නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR)</td><td>9.00%<br>10.00%</td></tr>
<tr><td>ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR)<br>නොවෙනස්ව පවතී</td><td>2.00%</td></tr>
</table>

**තොරතුරු සටහන:**

මහ බැංකු අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් 2023 නොවැම්බර් මස 24 වැනි දින පෙ.ව. 11.30ට ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්ථාගාරයේදී මාධ්‍ය හමුවක් පැවැත්වෙන අතර එය ෆේස්බුක් සහ යූ ටියුබ් ඔස්සේ සජීවීව විකාශය කෙරේ.

මීළඟ මුදල් ප්‍රතිපත්ති නිවේදනය නිකුත් කිරීමට නියමිත දිනය ඉදිරියේදී ප්‍රකාශයට පත් කෙරේ.

**ඇමුණුම 1**

## සංඛ්‍යා සටහන 01: උද්ධමනය

| මාසය | | ජන 23 | පෙබ 23 | මාර් 23 | අප්‍රේ 23 | මැයි 23 | ජූනි 23 | ජූලි 23 | අගෝ 23 | සැප් 23 | ඔක් 23 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස)** | කො.පා.මි.ද. (2021=100) | 51.7 | 50.6 | 50.3 | 35.3 | 25.2 | 12.0 | 6.3 | 4.0 | 1.3 | 1.5 |
| | ජා.පා.මි.ද. (2021=100) | 53.2 | 53.6 | 49.2 | 33.6 | 22.1 | 10.8 | 4.6 | 2.1 | 0.8 | 1.0 |
| **මූලික උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස)** | කො.පා.මි.ද. (2021=100) | 45.6 | 43.6 | 39.1 | 27.8 | 20.3 | 9.8 | 5.9 | 4.6 | 1.9 | 1.2 |
| | ජා.පා.මි.ද. (2021=100) | 52.0 | 50.1 | 44.2 | 31.8 | 21.6 | 11.3 | 6.3 | 4.1 | 1.7 | 0.6 |

*මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

## සංඛ්‍යා සටහන 02: මුදල් අංශයේ ප්‍රවණතා (තාවකාලික)

| දර්ශකය | ප්‍රමාණය (රුපියල් බිලියන)(අ) | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ජන 23 | පෙබ 23 | මාර් 23 | අප්‍රේ 23 | මැයි 23 | ජූනි 23 | ජූලි 23 | අගෝ 23 | සැප් 23 |
| සංචිත මුදල් | 1,590 | 1,505 | 1,424 | 1,417 | 1,559 | 1,436 | 1,374 | 1,407 | 1,244 |
| පුළුල් මුදල් සැපයුම (M2b) | 12,322 | 12,346 | 12,293 | 12,387 | 12,307 | 12,517 | 12,726 | 12,698 | 12,806 |
| ශුද්ධ විදේශීය වත්කම් | (1,573) | (1,434) | (1,174) | (1,039) | (838) | (808) | (707) | (612) | (560) |
| ශුද්ධ දේශීය වත්කම් | 13,895 | 13,780 | 13,467 | 13,426 | 13,144 | 13,325 | 13,433 | 13,309 | 13,366 |
| රජය වෙත ලබා දුන් ශුද්ධ ණය | 7,612 | 7,471 | 7,568 | 8,091(ආ) | 8,111 | 8,261 | 8,549 | 8,465 | 8,204 |
| රාජ්‍ය සංස්ථා/ රජය සතු වාණිජ ව්‍යාපාර සඳහා ලබා දුන් ණය | 1,748 | 1,712 | 1,605 | 1,147(ආ) | 1,084 | 1,096 | 1,097 | 1,091 | 1,099 |
| පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය | 7,318 | 7,260 | 7,141 | 7,093 | 7,004 | 7,080 | 7,093 | 7,098 | 7,168 |
| පුළුල් මුදල් සැපයුම (M4) | 14,891 | 14,906 | 14,868 | 14,981 | 14,885 | 15,093 | 15,335 | 15,330 | 15,446 |

(අ) විනිමය අනුපාතිකයේ වෙනස්වීම් හේතුවෙන් ඇතිවන බලපෑම 2022 මාර්තු මාසයේ සිට ආරම්භ වන කාල සීමාව තුළ මුදල් හා ණය සමස්ත සැලකිය යුතු ලෙස වෙනස්වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

(ආ) රජය සතු තෝරාගත් වාණිජ ව්‍යාපාරවල ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසිළිවෙළ යටතේ එකඟ වූ ක්‍රියාමාර්ගවලට අනුකූලව 2023 ජනවාරි මස 30 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඇපකර යටතේ පැවති නොපියවූ විදේශ විනිමය ණය 2022 දෙසැම්බර් මාසයේ සිට මධ්‍යම රජයේ ණය ලෙස සලකන ලදී. ඒ අනුව, මෙම ණය ගැළපුමේ කොටසක් 2023 අප්‍රේල් මාසයේදී සිදු කරන ලද අතර, එය අදාළ රාජ්‍ය බැංකුවේ ශේෂ පත්‍රයේ පිළිබිඹු වේ. මේ හේතුවෙන්, 2023 අප්‍රේල් මාසයේදී රාජ්‍ය සංස්ථා/ රජය සතු වාණිජ ව්‍යාපාර සඳහා ලබා දුන් ණය අඩු වූ අතර රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ඉහළ ගියේය.

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*

## සංඛ්‍යා සටහන 04: පොලී අනුපාතික

| **පොලී අනුපාතික (%)** | **2023 මැයි අවසානයට** | **2023 ජූනි අවසානයට** | **2023 ජූලි අවසානයට** | **2023 අගෝ අවසානයට** | **2023 සැප් අවසානයට** | **2023 ඔක් අවසානයට** | **2023 නොවැ 23 වැනි දිනට** |
|---|---|---|---|---|---|---|---|
| **ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 15.50 | 13.00 | 11.00 | 11.00 | 11.00 | 10.00 | 10.00 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 16.50 | 14.00 | 12.00 | 12.00 | 12.00 | 11.00 | 11.00 |
| **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR)** | 16.50 | 13.85 | 11.50 | 11.50 | 11.66 | 10.29 | 10.25 |
| **භාණ්ඩාගාර බිල්පත් එලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ)** | | | | | | | |
| දින 91 | 25.65 | 23.00 | 19.96 | 18.48 | 17.42 | 16.10 | 15.29 (අ) |
| දින 182 | 25.29 | 19.49 | 17.69 | 15.36 | 15.13 | 14.93 | 14.75 (අ) |
| දින 364 | 22.91 | 16.99 | 14.29 | 13.58 | 13.30 | 13.02 | 12.94 (අ) |
| **ණය පොලී අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (AWPR) (සතිපතා) | 20.29 | 19.47 | 17.18 | 15.29 | 14.67 | 13.88 | 13.14 (ආ) |
| බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය (AWLR) | 17.75 | 17.51 | 16.90 | 16.20 | 15.62 | 15.18 | - |
| බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය (AWNLR) | 22.39 | 21.51 | 19.30 | 17.89 | 16.57 | 15.98 | - |
| **තැන්පතු පොලී අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 15.23 | 15.09 | 14.76 | 14.15 | 13.39 | 12.75 | 12.11 |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 19.84 | 19.70 | 19.02 | 18.26 | 17.24 | 16.34 | 15.54 |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 18.85 | 14.98 | 12.45 | 11.46 | 11.47 | 11.51 | - |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR) | 19.19 | 15.49 | 12.76 | 11.81 | 11.82 | 11.78 | - |

(අ) 2023 නොවැම්බර් මස 22 වැනි දින පැවති වෙන්දේසියේ එලදා අනුපාතික
(ආ) 2023 නොවැම්බර් මස 17 වැනි දිනෙන් අවසන් වන සතිය සඳහා

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*